යටිනුවර ප්‍රාදේශීය සභාව.
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන.
----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** මතය.
------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.
-------------------------------------

**1.3.1** ගිණුම්කරණ අඩුපාඩු.
------------------------

පහත සදහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පලාන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් මාසයේ ලැබී තිබුණු ගැල්වනයිස් බට (GI) 520 ක වටිනාකම වූ රු.575,716 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු බෙහෙත් ද්‍රව්‍ය තොගයක වටිනාකම වූ රු.50,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සදහා ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඈ) විදුලි, ජල, පොදු යනා දි ගබඩා ද්‍රව්‍ය මිලදි ගැනීමේදි අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව මුළු වියදම ආදායමට එරෙහිව කපා හැර තිබුණි. මේ හේතුවෙන්, 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,690,640 ක් වටිනා ගබඩා ද්‍රව්‍ය ජංගම වත්කම්වල දක්වා නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.2,671,034 ක් වටිනා මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 25 ක වටිනාකම වූ රු.6,764,710 ක් හා වටිනාකම තක්සේරු කර නොතිබුණු ඉඩම් හා ගොඩනැගිලි 33 ක වටිනාකම ගිණුම්වලින් අත් හැරී තිබුණි.

(උ) ඉකුත් වර්ෂය තුළදි නව ගොඩනැගිල්ල සඳහා මිලදි ගෙන තිබුණු රු.4,262,844 ක් වටිනා ලී බඩු හා සවි කිරීම්වලින් රු.1,450,875 ක් පමණක් ගිණුම්වලට ගෙන ඇති බැවින්, රු.2,811,969 ක් වටිනා ලී බඩු හා සවි කිරීම් ගිණුම්වලින් අත් හැරී තිබුණි.

(ඌ) අයිතිය පවරා ගෙන නොතිබු රු.772,932 ක් වටිනා මෝටර් රථ 03 ක් හා වටිනාකම හදුනා නොගත් අංක 53-4744 කැබ් රථය ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

**------------------------------**

**ගිණුම් විෂයයන් 03 කට අදාළව ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.48,279,817 ක් වු අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.50,897,681 ක් වුයෙන්, රු.2,617,864 ක නොසැසදීමක් නිරීක්ෂණය විය.**

**1.3.3 ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කර තිබූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.118,225,067 ක් වූ අතර, එයින් අවුරුදු 01 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතු වටිනාකම රු.8,253,434 ක් වී තිබුණි.**

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කර තිබුණු ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතුව රු.100,439,310 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හී එකතුව රු.5,940,310 ක් වී තිබුණි.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**------------------------------------**

**ගිණුම් විෂයයන් 06 කට අදාළව අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා, එකතු වටිනාකම රු.30,429,795 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරික්ෂා කිරිමට නොහැකි විය.**

**1.3.6 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------**

**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 177 හා 178 වගන්තිවල විධිවිධාන වලට පටහැනිව ටෙන්ඩර් කැදවීමකින් තොරව ර.24,552,057 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ 86 කඉදි කිරීම් ප්‍රජා පාදක සංවිධානවලට පවරා තිබුණි.**

.

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,721,435 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,619,226 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.1,897,791 ක පරිහීමක් දක්නට ලැබුණි.**

**2.2 ආදායම් පරිපාලනය.**

**-----------------------**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය**

**---------------------------------------**

**ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

**------------------------------------------------------------**

**සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 දිනට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල් කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | අයකළ යුතු මුළු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,224,410 | 3,728,383 | 1,785,184 | 3,120,109 | 3,439,226 | 608,274 | 4,047,500 |
| ජල ගාස්තු | 212,457 | 1,051,885 | 162,563 | 831,832 | 49,894 | 220,053 | 269,947 |
| අක්කර බදු | 45,780 | 9,560 | 700 | 3,980 | 45,080 | 5,580 | 50,660 |
| බලපත්‍ර ගාස්තු | 11,145 | 1,611,916 | - | 1,611,916 | 11,145 | - | 11,145 |
| කඩ කුලී | 43,450 | 617,850 | 43,450 | 582,850 | - | 35,000 | 35,000 |
| උසාවි දඩ | 728,873 | 760,755 | 808,073 | 574,085 | (79,200) | 186,670 | 107,470 |
| මුද්දර ගාස්තු | 4,535,746 | 38,880,310 | 9,444,680 | 6,096,040 | (4,908,934) | 32,784,270 | 27,875,336 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,397,058 ක මුළු ආදායමක් හිඟ හිට තිබුණි.

**2.2.2** වරිපනම් බදු.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) වරිපනම් බදු වසර 05 කට වරක් තක්සේරු කර, ගාස්තු නියම කළයුතු වුවත්, 2006 වර්ෂයේ තක්සේරු වටිනාකම පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු රු.4,047,510 ක් වූ අතර, එම වටිනාකම තුළ වර්ෂ 01 ත් 10 ත් අතර කාලයක් තුළ හිග හිටි වරිපනම් බදු රු.3,439,225 ක් පැවතුණි. වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ බදුකරුවන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දේපළ 90 කින් වසර 02 ත් 10 ත් අතර කාලයක් පැරණි අය නොවී පැවති රු.618,200 ක වරිපනම් බදු අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**2.2.3** සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

---------------------------

i. සභාවේ අනුමැතිය ලබා නොගෙන සම්ප්‍රේෂණ කුළුණු 03 ක් අනවසරයෙන් ඉදි කර තිබූ අතර, ඒ සඳහා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව, උස සෑම මීටර් 05 කටම රු.10,000 ක් බැගින් වූ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සම්ප්‍රේෂණ කුළුණු 12 ක සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම්වලින් වාර්ෂික ව්‍යාපාර බදු අය කර ගතයුතු වුව ද, සමාගම් 03 ක් හැර අනෙකුත් සමාගම් මගින් ව්‍යාපාර බදු අය කර ගෙන නොතිබූ අතර, ඒවා ඉදි කිරීම සඳහා අනුකූලතා සහතික ද ලබා ගෙන නොතිබුණි.

**2.2.4** ජල ගාස්තු.

-----------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි ජල ගාස්තු රු.269,947 ක් වූ අතර, මෙයින් රු.38,038 ක් වූ හිඟ ගාස්තු පරිභෝගිකයන් 14 දෙනෙකුට අයත් වර්ෂයක් ඉක්ම වූ ජල ගාස්තු විය. මෙම ශේෂයෙන් 2015 ජුනි 30 දිනට රු.18,267 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

**2.2.5** දැන්වීම් පුවරු ගාස්තු

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1893 දරන යටිනුවර ප්‍රාදේශීය සභාවේ ගැසට් නිවේදනය අනුව, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දැන්වීම් පුවරු වෙනුවෙන් ගාස්තු අය කළයුතු බවට නියමයන් පනවා ඇතත්, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දැන්වීම් පුවරු 29 කින් රු.915,000 ක් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.107,470 ක් හා මුද්දර ගාස්තු රු.27,875,336 ක් ලැබියයුතුව පැවතුණි. එසේ වුවත් උසාවි දඩ රු.79,200 ක් හා මුද්දර ගාස්තු රු.4,908,934 ක් ඉකුත් වර්ෂ වල බිල් කළ මුදලට වඩා වැඩිපුර ලැබී තිබුණ බැවින් බිල් කළ ආදායමෙන් අය නොවූ ශේෂයන් අඩු කර දක්වා තිබුණ. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙ ගිණුම් වල දෙසැම්බර් 31 දිනට දක්වා තිබුණු හිඟ ශේෂය දෝෂ සහගත වී තිබුණි.

**2.2.7** පරිසර බලපත්‍ර ගාස්තු

----------------------

2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ පාරිසරික අමාත්‍යාංශයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව කර්මාන්ත ව්‍යාපාර ආයතන 20 ක් පරිසර බලපත්‍ර ලබා නොගෙන, ව්‍යාපාර පවත්වා තිබුණි. මේ හේතුවෙන්, රු.146,600 ක බලපත්‍ර ආදායම් ද අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.2.8** වෙනත් ආදායම්

------------------

ගොඩනැගිලි සැළසුම් අනුමත කර ගෙන තිබුණු නේවාසික හා ව්‍යාපාරික ස්ථාන 17 ක අනුකූලතා සහතික ලබා ගැනීමකින් තොරව පදිංචි වී තිබීම හේතුවෙන්, 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනයේ නියමයන් අනුව එම පදිංචිකරුවන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.970,500 ක මුදලක් දඩ වශයෙන් අය කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.
---------------------------------

වර්ෂ 05 ක කාලයක සිට ගිණුම් විෂයයන් 02 කට අදාළව අය නොවී පවතින රු.3,455,392 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ක්‍රියාත්මක නොමැති රු.329,137 ක් වූ බැංකු ශේෂ සහිත ජංගම ගිණුම් 02 ක් ලංකා බැංකුවේ පවත්වා තිබුණි.

(ආ) සභාවේ ජංගම ගිණුමේ වර්ෂය පුරා සෑම මාසයකම රුපියල් මිලියන 30 කට වැඩි මුදල් ශේෂයක් පැවති බව නිරීක්ෂණය වූ අතර, උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ක්ෂේත්‍රයක ආයෝජනය කිරීමකින් තොරව මෙසේ විශාල මුදලක් ජංගම ගිණුමක රඳවා ගැනීමට හේතු අනාවරණය නොවුණි.

(ඇ) සභා සේවයෙන් විශ්‍රාම ගොස්, හා ඉවත්ව ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන රු.289,841 ක ණය මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගොස් සිටි නිලධාරීන් 07 දෙනෙකුගේ රු.23,398 ක සේවක ඇප තැන්පත් සුදුසුතාවය පරීක්ෂා කර, ආපසු ගෙවීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් 42 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණු අතර, නියැදියක් ලෙස කරන ලද පරීක්ෂාවේ දී අවස්ථා 05 කදී අනවසර ඉදි කිරීම්වලට අදාළ රු.100,930 ක දඩ මුදල් අය කර ගෙන නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.
---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.36,375 ක් වටිනා ගබඩා උපකරණ ඒකක 85 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර ඒ සම්බන්ධව සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම හඳුනා ගෙන නොතිබුණු කාර්යාල උපකරණ හා ලී බඩු උපකරණ ඒකක 230 ක් දීර්ඝ කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණු අතර ඒවා වෙන්දේසි කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය.
-------------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ නිලධාරීන් විසින් සිදු කළ පරීක්ෂාවන්ට අදාළ වාර්තා නිකුත් කළ ද, අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය.**

**-------------------**

**සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සමග තථ්‍ය ආදායම් හා වියදම් සැසදීමේ දි ආදායම් විෂයයන් 06 ක සියයට 25 සිට සියයට 100 ඉක්මවා ද, වියදම් විෂයයන් 04 ක සියයට 74 සිට සියයට 100 ඉක්මවා ද, විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**
**(ආ) අයවැය පාලනය.**
**(ඇ) ආදායම් පරිපාලනය.**
**(ඈ) වත්කම් කළමනාකරණය**